# කෑගලු දිස්ත්‍රික්කයේ අධ්‍යාපනික සංවර්ධනය

ටී. ගුණරත්න

ඓතිහාසික සතර කෝරළය හා තුන් කෝරළය එනම්, ගල්බොඩ, කිණිගොඩ, පරණකුරු, දෙහිගම්පල්, පාත බුලත්ගම, අටලුගම හා පනවැල් යන කෝරළ එකතුවීමෙන් සැදුම් ලද කෑගලු දිස්ත්‍රික්කය, වර්තමාන අරණායක, මාවනැල්ල, රඹුක්කන, කෑගල්ල, ගලිගමුව, දැදිගම, රුවන්වැල්ල, යටියන්තොට, දෙහිඕවිට, දරණියගල, යන අධ්‍යාපන කොට්ඨාශයන්ගෙන් සමන්විත වෙයි. සරුසාර භූමි; සුවදායි දේශගුණය එහෙත්, ජල, වන හා ගිරි දූර්ගයන් ගෙන් සැදුම් ලද මෙම පෙදෙස, පෙර රජ දරුවන් සමයේ රට රැක්මෙහිලා පිහිට වූ ආරක්ෂිත පෙදෙසක් විය. රජවරුන්, නායකයන්, පඬිවරුන්, හිමිවරුන් සහ ලෝ පතළ කීර්තිමත් බුද්ධිමතුන් මෙ පෙදෙසින් බිහි වූ බවට සාක්ෂි ඇත. මෙකල ද එසේම ය. එබැවින්, මෙහි පාසල් හා අධ්‍යාපන කටයුතු අතීතයේ සිට වර්තමානය දක්වා විමර්ශනාත්මකව විග්‍රහ කිරීම මේ පෙදෙසට පමණක් නොව, මුළු රටටම වැදගත් වන බැවි සඳහන් කළ යුතුය.

කෑගලු දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කටයුතු කාල වශයෙන් කොටස් කිහිපයකට බෙදා විමසිය හැකිය. එනම්,

1. ඈත අතීතයේ සිට ක්‍රි.ව.1505 දක්වා කාලය
2. ක්‍රි.ව.1505 සිට පෘතුගීසි පාලන සමය 1648 දක්වා
3. ක්‍රි.ව.1648 සිට 1798 ලන්දේසි පාලන සමය
4. ක්‍රි.ව.1802 සිට 1948 දක්වා ඉංග්‍රීසි පාලන සමය

5. ක්‍රි.ව.1948 සිට 1956 දක්වා කාලය
6. ක්‍රි.ව.1956 සිට 1961 දක්වා කාලය
7. ක්‍රි.ව.1961 සිට 1977 දක්වා කාලය
8. ක්‍රි.ව.1977 සිට මේ දක්වා කාලය වශයෙනි.

මෙම වකවානු කෙටියෙන් විග්‍රහ කිරීමෙන් අද අපට අවශ්‍ය අධ්‍යාපනික ගමන් මග නිර්ණය කර ගත හැකිය.

පැරණි අනුරපුර, පොළොන්නරු, දඹදෙණි, කුරුණෑගල ආදී රාජධානි බිඳවැටෙන සමයේ එනම් ක්‍රි.ව.10 වන සියවසේ පටන් කෑගල්ල දිස්ත්‍රික්කය ඉතා වේගයෙන් ජනාවාස වූ බවට සාක්ෂ්‍ය ඇත. වැඩවසම් පාලනය ද ඒ සමඟ ම ඇති විය. රාජ්‍ය අවුල් වියවුල් සහිත මෙවැනි අවධිවල ශාස්ත්‍රීය කටයුතු අඩපණ වුවත්, දේශමාමක භික්ෂූන් වහන්සේලාගේ උනන්දුව නිසා පන්සල් ආශ්‍රිත අධ්‍යාපන කටයුතු ඉතා අපහසුවෙන් වුව ද පවත්වාගෙන යන ලදී. ගම්පොළ රාජධානි සමයෙහි කෑගල්ල දිස්ත්‍රික්කයේ අලවතුරෙ, ගනේගොඩ, විහාරයෙහි වැඩ විසූ ධර්මකීර්ති මාහිමියන් විසින් බෞද්ධ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යන ලදී. ඉන්පසු කාලවල බෙලිගල් කෝරළේ වට්ටාරම, මල්මහපාය ද, පරණකුරු කෝරළේ දිප්පිටියේ, රාජගිරි මල්පාය ද, මාවනැල්ල, තප්පාගොඩ, බ්‍රහ්මවර්ධනපාය, අලුත්නුවර දැඩිමුණ්ඩ දේවාලය ආසන්න පෙදෙසෙහි, අස්සද්දනා පිරිවෙන ද, කිණිගොඩ කෝරළේ නාරන්බැද්දේ ටැම් ලිපියේ, සඳහන් වන පරාක්‍රම පිරිවෙන ද, උස්සාපිටියේ වහරක්ගොඩ ටැම් ලිපියේ සඳහන් වන මහපියා පිරිවෙන ද, වාතගිරි පර්වතයෙහි මයුරපාද නමින් පිරිවෙනක් ද, කන්ද උඩරට රාජ්‍ය සමයෙහි ලෙව්කේරාළ නම් ආචාර්යවරයෙකු විසින් අලගල්ල අසල ගෙන ගිය අධ්‍යාපන කටයුතු ද යන වශයෙන් අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාමේ සංවිධානාත්මක පිරිවෙන් ක්‍රමයක් මෙම ප්‍රදේශයේ

තිබූ බව පෙනේ. මෙකල දෙවනගල රත්නාලංකාර නම් මාහිමි නමක් වැඩ විසූ බවත්, ඒ හිමියන් ආගමික හා අධ්‍යාපනික කටයුතු කරගෙන ගිය බවත් දෙවනගල ශිලා ලිපියෙන් හෙළිවන බව මහාචාර්ය පරණවිතාන ශූරීන් පෙන්වා දී ඇත.

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් එක්සිය දසවැන්නෙහි ධර්මයට දිවි පුදා බුදු බව පතා

ආමිස ප්‍රතිපත්ති පූජා කොට ඉන්නා රත්නාලංකාර ස්වාමීන්ද්‍රයන් විසින් දෙවනගල .....

යනා දි වශයෙන් කෙරෙන දීර්ඝ විස්තරයකින් එය සනාථ වේ. මේ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ පැවති මෙම පිරිවෙන් මඟින් සෑහෙන අධ්‍යාපනයක් ලබා දුන් බව ද ගනදෙවි හැල්ල, වදන් කවිපොත, ප්‍රත්‍යශතකය, බුද්ධ ගජ්ජය, සකස්කඩ, නම් පොත, සිදත් සඟරාව හා ආගමික පොත් ද පාලි හා සංස්කෘත ආදී භාෂා ද අකුරු ලිවීම යනාදිය මෙම පිරිවෙන්හි උගන්වන්නට ඇතැයි සිතිය හැකිය.

1505 දි සිදු වූ පෘතුගීසීන් ගේ ලංකාගමනය, මෙරට අධ්‍යාපන වෙනසකට හේතු විය. රෝමානු කතෝලික ආගම් ප්‍රචාරයට හොඳම මඟ අධ්‍යාපනය බව වටහා ගත් මොවුන්, කෑගලු දිස්ත්‍රික්කයේ වැඩවසම් සමාජ (කුල) ක්‍රමයට අනුව ජීවත්වූ ජනතාව කතෝලික අධ්‍යාපනය මඟින් අවනත කර ගැනීමට කටයුතු කරන ලදි. ප්‍රැන්සිස්කන්, ජේසුයිට්, ඩොමිනිකන්, ඔගස්ටිනීන් ආදි නිකායන් මඟින් දිස්ත්‍රික්කයේ පාසල් කටයුතු කරගෙන යන ලදි. මෙම පාසල්වල කියවීම, ලිවීම හා ආගම ඉගැන්වූ බව ද සිංහල රජවරුන් මෙන් පෘතුගීසීන් ද පාසල් හා අධ්‍යාපන කටයුතු සඳහා ඉඩකඩම් පවා ලබා දෙන ලද බවට ද සාක්ෂි ඇත. මේ අනුව පල්ලිය හා පාසල කතෝලික ආගමෙහි ප්‍රචාරක මාධ්‍ය ලෙස භාවිත කර ඇත. වැඩවසම්

සමාජ ක්‍රමය හා කුල ක්‍රමය නිසා පීඩනයට පත්වී සිටි සාමාන්‍ය ජනතාව මෙම ක්‍රමවේදයනට වශීකෘත වූ අතර සිය පෞද්ගලික ලාභ අලාභ මත ආගම ඉත සිතින් වැළඳ ගත්තා විය හැක. ලන්දේසීන්, පෘතුගීසීනට වඩා ක්‍රමවත් ව ජනතාව තමන්ට පක්ෂපාත කර ගැනීම සඳහා අධ්‍යාපනය මාවතක් කරගත් බව පැහැදිළිය. අධ්‍යාපනය රජයේ වගකීමක් ලෙස පෙන්වා දුන් ලන්දේසීන් විසින් ඉතා විධිමත් සංවිධානාත්මක අධ්‍යාපන වැඩ පිළිවෙලක් දියත් කර ඇත. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ දක්නට ලැබෙන පල්ලි හා පාසල් අතීත කතෝලික ව්‍යාප්තිය හෙළි කරයි. "කුඩාගම හේවාදිවෙල" කතෝලික අධ්‍යාපනය පැතිරගිය අන්දම මීට හොඳ නිදසුනකි. ඔවුන් විසින් වඩාත් සැලසුම්ගතව අධ්‍යාපනය දියත් කළ අතර, අධ්‍යාපන විමධ්‍යගත පාලනයත්, විෂයමාලා කටයුතු, ගුරු කටයුතු, පරීක්ෂණ, අනිවාර්ය අධ්‍යාපනය, පාසල් හැරගිය අයට අධ්‍යාපනය ආදිය ද මෙකල අරඹන ලදී.

ලන්ද පාලන සමයේ තුළ අධ්‍යාපන කටයුතු මැනවින් මෙහෙයවීම සඳහා එවකට පැවති ස්කෝලාකල් කොමිසමේ තීරණ පරිදි කෑගල්ල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් අධ්‍යාපන කටයුතු පාලනය කිරීම සඳහා මණ්ඩලයක් පත් කළ අතර, එහි සභාපති ධූරයෙන් නීල බලයෙන් ම පළාතේ දිසාපති තෝරා ගෙන ඇත. ආණ්ඩුකාරයා විසින් පත්කරන ලද ගිහි පැවිදි නියෝජිතයන්ගෙන් සමන්විත මණ්ඩලයක් තුබූ බව පෙනේ. මණ්ඩලයක වූ පරීක්ෂකවරයා පාසල්වලට ගොස් පරීක්ෂා කර වාර්තා කළ යුතු විය. ළමුන්ගේ පාසල් යාම අනිවාර්ය කරන ලද නමුදු, කෑගල්ල දිස්ත්‍රික්කය වැනි ප්‍රදේශ ගැන ලන්දේසීන් වැඩි උනන්දුවක් දක්වා නැත. අනාථ සිසුන් සඳහා පාසල් පැවැත් වූ අතර, එය ආගමිකයන් වැඩි කර ගැනීමට හේතු විය. පෘතුගීසි කාලයේ ආරම්භ වූ කතෝලික ආගමික කටයුතු ලන්දේසීන්ට පහසුවක් විය.

ලන්දේසීන්, පෘතුගීසීන්ට වඩා සංවිධානාත්මක අධ්‍යාපන ක්‍රමයක් ගෙන ගිය අතර, කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාව මඟින් උඩරට ඇති විය හැකි පක්ෂපාති බව බිඳ දැමීමට ද එය උපයෝගී කර ගති. එහෙත් අධ්‍යාපනය අතින් විශාල ව්‍යාප්තියක් පෘතුගීසි හෝ ලන්දේසි කාලවල ඇති වූ බවට සාක්ෂි නැත.

ක්‍රි.ව. 1797 දි ඉංග්‍රීසීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමෙන් පසු එනම් සර් පෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරයාගේ කාලයට පසු, අධ්‍යාපන සංවිධානය නැවත රට තුළ ඇති විය. එහෙත් මෙම මුල් කාලය තුළ දි ඉංග්‍රීසීන්ට කෑගල්ල දිස්ත්‍රික්කය උවමනා වූයේ, උඩරට රාජ්‍ය අල්ලා ගැනීම සඳහා උපකාර ගැනීම සඳහා පමණි. ජේම්ස් කෝඩිනර් දේවගැතිවරයා විසින් ඉංග්‍රීසීන්ට උවමනා අධ්‍යාපන කටයුතු සැලසුම් කරන ලදි. මුළු දිවයින පුරා ඇති වූ ඉතා දුළු අධ්‍යාපන පුනරුත්ථාපනයේ බලපෑම මිස, කෑගල්ල දිස්ත්‍රික්කයේ විශේෂ යමක් සඳහන් කිරීම අපහසුය. මෙකල ඕලන්ද යුගයේ පැවති පාසල් නැවත ඉගැන්වීමට යොදා ගැනීමෙන් කියවීම, ලිවීම හා ආගම උගන්වන ලදි. ගැමි පාසල් වලට අමතරව සුපිරි පාසල් ද ඇති විය. මේ අතර සිංහල, දෙමළ හා බර්ගර් නම් පාසල් ද විය. 1830 වන විට ඇති කළ මෙම පාසල් කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි බවට සාක්ෂි නැත. 1830 වන විට දිවයින පුරා පැවති පාසල් සංඛ්‍යාව වූයේ 973 ක් පමණි. ඒ මෙසේයි.

| | පාසල් | ළමුන් | ප්‍රතිශතය |
|---|---|---|---|
| මිෂනාරි | 236 | 9274 | 47 |
| රජයේ | 97 | 1914 | 40 |
| පෞද්ගලික | 640 | 8424 | 43 |

1833 වන විට මේවා ද අවුල් විය, වියදම් පිරිමසා ගැනීමට කටයුතු කළ අතර, කෑගල්ල දිස්ත්‍රික්කය වැනි ප්‍රදේශ නොසලකා හරින ලදි. මාධ්‍ය භාෂාව ඉංග්‍රීසි කිරීම නිසා ද රජයේ සේවයට ඉංග්‍රීසි අවශ්‍ය වූ නිසා ද සමාජ භේදයට අඩිතාලම වැටෙමින්, ගැමි පාසල් පද්ධතිය නොසලකා හැරිණ. ධන හිමි ඉංග්‍රීසි උගත් පන්තියක ආරම්භය ඇති විය. ටොරින්ටන් ආණ්ඩුකාරයා සඳහන් කළ අන්දමට, "අධ්‍යාපනය ආගමට හරවා ගැනීමේ හොඳම මාර්ගය විය". වෙස්ලියන් නිකාය හා වෙනත් නිකායයන් විසින් ද මෙම අදහස අනුව දූප්පතුන් ආගමට හරවා ගැනීම් සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසල් කිපයක් ඇති කරන ලදි. 1870 වන විට ආධාර ලබන පාසල් 814 දක්වා වැඩිවී තිබුණත් කෑගල්ල දිස්ත්‍රික්කයේ කතෝලික පාසල් පවා ඇරඹුණේ ඊටත් පසුවය. මුළු සබරගමු පළාතට ම තිබුණේ පාසල් 93 කි. කෑගල්ල දිස්ත්‍රික්කයේ පැවති වැඩවසම් ක්‍රමයට අධ්‍යාපනය නිසා භාෂාව පදනම් කර ගත් පන්ති භේදයක් ඇති වීම, පිරිහීමට මිස දියුණුවට හේතු නොවීය. ඉංග්‍රීසි උගත් සුපිරි පාසල් දරුවන් ද සාමාන්‍ය පාසලේ උගත් දරුවන් ද කෝල්බෲක් යෝජනාවලින් පසු බලාපොරොත්තු වූයේ කාර්යාලයක, වැවිලි ව්‍යාපාරයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ලිපිකාර රැකියාවකි. මේ නිසා පන්ති භේදය මෙන් ම මේ රටේ දියුණුවට නොගැලපෙන රැකියා විරහිත පන්තියක් ද ඇති විය. කෑගල්ල දිස්ත්‍රික්කයේ මේ අධ්‍යාපනය ලද පිරිස් කොළඹට ඇදී යාමට එය ද හේතුවක් වන්නට ඇත.

20 වන සියවසේ මුල් භාගය වන විට යටත් විජිත ආර්ථික ක්‍රමයෙන් පොහොසත් වූ කෑගල්ල දිස්ත්‍රික්කයේ පවුල් කිහිපයක් විසින් තම දරුවන්

මෙරට පමණක් නොව, එංගලන්තයට පවා යවා උගන්වා ඇත. 20 වන සියවස මුල් භාගයේ දී සංගණන වාර්තා අනුව, අරුණාචලම් මහතාගේ ඉල්ලීම පරිදි 1903 දී සී.ඊ. ෂ්වෝන් මහතා විසින් යටත් විජිත ලංකාවේ අධ්‍යාපන තත්වය එංගලන්ත පාර්ලිමේන්තුවේ සැලකිල්ලට යොමු කරවන ලදි. ඒ අනුව ලංකාවේ 3565964 ජනගහනයෙන් 2790255 කට කියවීම සහ ලිවීම නොහැකි බව පෙන්වා දෙන ලදි. සබරගමුව හා ඌව පළාතේ දුෂ්කර ප්‍රදේශ හා මධ්‍යම පළාතේ බොහෝ ප්‍රදේශවල පාසල් නොවීය. මෙකල පාසල් යැවීමේ දුර ප්‍රමාණය වූ සැතපුම් 3 ක් ඇතුළත පාසල් නොවීය. මේ වන විට පාසල් යන වයසේ ළමුන්ට පාසල් යාම අනිවාර්ය කර තිබුණත්, දුෂ්කර මහ ගෙවා යා නොහැකි විය. මෙම මුල් දශක තුළ මුදල් හිමි අය විසින් තවත් උපක්‍රමයක් යොදන ලදි. එනම් නම, ගම ලිවීමට හැකි දුගී ළමුන් ගෙවල්වල බැල මෙහෙවරට යොදා ගැනීමය. කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉතාම ගැමි ප්‍රදේශවල දරුවන් අදත් යොදා ගැනීමෙන් ම එය වැඩිදුරටත් සනාථ වේ. 1901 පමණ වන විට ලිවීමට හා කියවීමට හැකි සංඛ්‍යාව 34.7 සේ ගණන් බලා ඇත. මෙම සංඛ්‍යාලේඛන ගණනය කර ඇත්තේ පැරණි ආරච්චි මහත්වරුන් විසිනි. සත්‍යය කුමක් වුවත් ජනගහනය 1237157 පිරිමි සහ 1553 078 ගැහැණුන්ගෙන් 657615 පිරිමි සහ 115581 ගැහැණු හට ලිවීම හා කියවීම පුළුවන් වූ බව සඳහන් වේ. මෙය සමහර විට සත්‍යයක් විය හැක්කේ මේ වන විටත් පන්සල් අධ්‍යාපනය තිබූ බැවිනි. 1901 දී පිරිමි 31.1% ක් ද ගැහැණු 2.7% කට ද සාක්ෂරතාව තිබූ බව සඳහන් වේ. 1911 වන විට 34.3 පිරිමි ද 3.5 ක් ගැහැණු ද විය. 1902 කාලය වන විට උගන්වන විෂය වෙනස් කිරීමට ද ඒ අනුව කිසියම් කෘෂිකර්ම හා කාර්මික කටයුතු විෂයට ඇතුළත් කිරීමට ද උත්සාහ ගෙන තිබිණ. 1909 දී කෘෂිකර්ම පුහුණුව ගම්බද පාසල්වල

කරවන ලදි. 1912 අධ්‍යාපන දෙපාර්තමේන්තුව සකස් කළ පොත්වල එය තිබූ බවත්, පාසල් 282 ක වතු වගා වාර්තා තිබූ බවත් සඳහන් වේ. මේ වන විට කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසල් ප්‍රමාණය ද වැඩි විය. 1929 වන විට පාසල් යන වයසේ ළමුන්ගේ පැමිණීම අනිවාර්ය කර තිබිණ. 1943 වන විට ඇතුළත් කිරීමේ වයස අවුරුදු 5 විය. 1930 සංඛ්‍යා ලේඛන අනුව සබරගමුවේ 45% ක් පාසල් යන වයසේ ළමුන්ට අධ්‍යාපනයක් ලැබී නැත. කෑගල්ල දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල ආධාර, නවාතැන් මදිකම නිසා ගුරු හිඟය බලපා ඇත. 1924 ළමුන් 209 605 ක් පාසල් ගොස් ඇත. මින් මුළු සබරගමු පළාතේ ම පාසල් ගිය සංඛ්‍යාව ළමුන් 997 කි. රජයේ පාසල් වලට 6260 ක් ද ආධාර පාසල්වලට 1588 ක් ද ආධාර නොලබන පාසල්වලට 2089 ක් ද වශයෙන් විය. 1900 දී මුළු සබරගමු පළාතටම ප්‍රාථමික ඉංග්‍රීසි පාසල් තිබුණේ 2 කි. සාමාන්‍ය පාසල් 78 කි. එනම් මුළු පාසල් 80 කි. ආධාර ලබන ඉංග්‍රීසි පාසල් 3 ක් ද සාමාන්‍ය පාසල් 23 ක් ද විය. ආධාර නොලබන පාසල් 2 ක් හා සාමාන්‍ය පාසල් 19 ක් විය. මෙය පසුව වර්ධනය වී ඇත. මේ අනුව 1833 සිට 1900 කාලය තුළ කෑගල්ල දිස්ත්‍රික්කයේ යටත් විජිත අධ්‍යාපනය ඉතා සෙමින් වර්ධනය වූ බව කිව හැක.

1900 සිට 1945 කාලය තුළ ඇති වූ අධ්‍යාපන රාජ්‍ය ප්‍රතිපත්ති, කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පාසල් ප්‍රමාණය, ශිෂ්‍ය සහභාගිත්වය ක්‍රමානුකූල වර්ධනයකට යොමු කරන ලද බව පෙනේ. මේ කාලය තුළ දිස්ත්‍රික්කයේ විවිධ ආගමික සංවිධාන විසින් පාසල් ඉදි කොට තිබිණ. මේවා තරගකාරී විය. ඉංග්‍රීසි කොලිජි නාගරික ප්‍රදේශවල ඇති වීම නිසා තරමක් මුදල් ඇති අයට ඉංග්‍රීසි ඉගෙනීමට ලැබිණ. මෙකල ප්‍රාථමික අධ්‍යාපනය ගැන යටත් විජිත ආණ්ඩුව වැඩි සැලකිල්ලක් දැක්වීම,

අධ්‍යාපනය අනිවාර්ය කිරීම, අකුරු දන්නා අයගේ සංඛ්‍යාත්මක වර්ධනයක් ඇති වීමට හේතු විය. 1946 දී ගණන් බැලූ අන්දමට කෑගල්ල දිස්ත්‍රික්කයේ පිරිමි සියයට 70.1 ට ගැහැණු සියයට 43.8 කට අක්ෂර දැනුම තිබිණ. 1950 වන විටත් පාසල් වැඩි සංඛ්‍යාවක් කතෝලික වූ අතර, එම පාසල්වල මාධ්‍ය භාෂාව වූයේ ඉංග්‍රීසි ය. ඒවායේ උගත් අය නව මධ්‍යම පන්තියක් බවට පත් වූහ. කුමන හෝ දැනුමක් ලබා සිටි පිරිස අතර පන්ති, කුල භේද උග්‍ර කිරීමට මෙම අධ්‍යාපනය ඉවහල් වී තිබිණ. මේ වන විට එංගලන්තයට ගොස් පැමිණ සිටි වාමාංශික මාක්ස්වාදී කණ්ඩායම් කෑගල්ල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කටයුතු ගැන උනන්දු වූහ. 1921 විශ්වවිද්‍යාල කොලිජියක් ඇති කිරීමත්, 1931 ඡන්දයෙන් අධ්‍යාපන ඇමති පත් කිරීමේ යෝජනාවත්, අධ්‍යාපන හා පාසල් කටයුතු කෙරෙහි මනා බලපෑමක් ඇති කිරීමට ආධාර විය. 1935 කෑගල්ල දිස්ත්‍රික්කයේ විශේෂයෙන් තුන් කෝරළයේ ඇති වූ මැලේරියා වසංගතය සමඟම අධ්‍යාපනය, නිවාස, සෞඛ්‍යය පිළිබඳ වාමාංශික හඬ ජනතාව අතරට යාමටත්, දේශපාලන බලපෑම් ඇති කිරීමටත් හේතු විය. රජයේ පාසල් වැඩි කිරීමට ද මේ නිසා හැකි විය. කම්කරු ව්‍යාපාර සමඟ වතු පාසල් ද ඇති විය. යටියන්තොට, දැරණියගල වතු පාසල් රාශියක් අලුතින් ඇති කරන ලදී. 1930 වන විට කලින් පැවති මතභේදය අතරට දෙමළ, සිංහල, මුස්ලිම් වශයෙන් පාසල් භේදයක් ද මේ නිසා ඇති වූ බව කිව යුතුය. කෑගල්ල දිස්ත්‍රික්කයේ මේ දක්වා ඉංග්‍රීසි මාධ්‍ය පාසල් අතලොස්සක් වූ අතර, පාසල් යන වයසේ ළමුන්ගෙන් එම පාසල්වලට ගියේ සියයට 5 කටත් වඩා අඩු ප්‍රමාණයකි, ඒ ද මුදල් ගෙවිය හැකි අය පමණි. ඒ සමඟම මේ පාසල්වලට වඩ වඩා ආධාර ද දෙන ලදී. ආණ්ඩුව අධ්‍යාපනයට කරන වියදමින් 37% ක ඉංග්‍රීසි පාසල්වලට දෙන ලදී. 1931 දී 7%ක් පාසල් ළමුන් සඳහා මෙම ඉංග්‍රීසි පාසල්වලට

රු.686106.00 ක් වියදම් කළ අතර, 93%ක් ළමුන් සඳහා වියදම් කරන ලද්දේ රු.1603204.00 ක් වීම කණගාටුදායකය. මෙම වකවානුව තුළ බෞද්ධ සමාගම් ඉදිරිපත් වී බෞද්ධ අයට ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි පාසල් කිහිපයක් පිහිටුවන ලදි. ඒ අතර කෑගලු බාලිකා හා කෑගලු මහා විද්‍යාලය ප්‍රධාන තැනක් ගනී. 1942 විශ්වවිද්‍යාල කොලිජිය පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම ද මේ නව දියුණුවට ඉවහල් විය. මෙම දියුණුව ඇති වුවත්, සංඛ්‍යාලේඛන වලින් හෙළිවූයේ දිස්ත්‍රික්කයේ පාසල් යන වයසේ අවුරුදු 5–12 ළමුන්ගෙන් 45%ට අධ්‍යාපනයක් නොලැබුන බවයි.

1940 න් ආරම්භ වූ දශකය තුළ ඇති වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මත කෑගල්ල දිස්ත්‍රික්කයේ මධ්‍ය මහා විද්‍යාල කිහිපයක් පාසල් පද්ධතියට එකතු විය. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමාගේ යෝජනා පරිදි මේ දක්වා පැවති භාෂා භේද, ආගම් භේද, කුල භේද ආදියෙන් තොර අධ්‍යාපනයක උදෙසා අඩිතාලම වැටිණ. කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉංග්‍රීසි පාසල්වල මේ වන විට ශිෂ්‍ය ජනගහනයෙන් 10% කට ත් අඩු සංඛ්‍යාවක් ඉගෙනුම ලත් අතර, 90% ක් පමණ සිංහල, දෙමළ, මුස්ලිම් රජයේ, පෞද්ගලික ආධාර ලබන, නොලබන පාසල්වල ඉගෙන ගත්හ. සාමාන්‍ය ජනයාගේ ළමුනට අධ්‍යාපනයේ සාධාරණයක් නොවීය. මෙහිදී තෝලංගමුව මධ්‍ය විදුහල, අරණායක රිවිසඳ මධ්‍ය විදුහල, රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය විදුහල පිහිටුවීමෙන් හැකි ප්‍රමාණයක් හෝ සිංහල ළමුනට නිදහස් අධ්‍යාපනයක් දීමට උත්සාහ ගෙන ඇත. මේ නිසා ප්‍රදේශයේ ඉංග්‍රීසි අධ්‍යාපන කටයුතු ද පුළුල් විය.

කන්නන්ගර යෝජනා පරිදි , රට අභ්‍යන්තර ගම් කරා අධ්‍යාපන අවස්ථා පැතිරවීමේ ප්‍රතිඵලයක් ලෙස

1950 දශකයේ දි මහා විද්‍යාලය ඇති කළ අතර, විද්‍යා, ගණිත විෂයයන් ඉගැන්වීම ඇරඹිණ. මෙම සියලු විද්‍යාලයවලින් උගත් පිරිස රටේ ආර්ථිකයට දායක වූයේ සිවිල් නිලධාරීන්, ගුරුවරුන්, ලිපිකරුවන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් වශයෙනි. 1960 වන විට 1956 දේශපාලන වෙනස ත්, භාෂා මාධ්‍ය වෙනසත් හේතුවෙන් පාසල් සංඛ්‍යාව 67% දක්වා වැඩි විය. 1956 දි එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරණායක අගමැතිතුමා විසින් යොමු කළ ස්වභාෂා අධ්‍යාපනය ඉතා ජනප්‍රිය විය. කිසියම් මානසික නිදහසක් ලැබිණ. සිංහලය රාජ්‍ය භාෂාව කිරීම නිසා බොහෝ දෙනෙකුට විශ්වවිද්‍යාල අධ්‍යාපනයට අවස්ථා ලැබීම විශාල සමාජ පෙරළියකට හේතු විය. අධ්‍යාපන කටයුතු ප්‍රමාණාත්මකව වර්ධනය විය. එම වර්ධන වේගය පහත සඳහන් පරිදි වේ.

**1953 සිට 1991 වර්ෂ අතර සිසු - ගුරු අනුපාතය**

| වර්ෂය | පාසල් ගණන | ශිෂ්‍ය සංඛ්‍යාව | ගුරු සංඛ්‍යාව | සිසු – ගුරු අනුපාතය |
|---|---|---|---|---|
| 1953 | 6731 | 1564848 | 45335 | 34.5 |
| 1963 | 9327 | 2460654 | 81211 | 30.2 |
| 1971 | 9646 | 2689638 | 94583 | 28.4 |
| 1981 | 9521 | 3369694 | 31658 | 25.4 |
| 1991 | 9009 | 4135114 | 70735 | 24.0 |

කෑගල්ල දිස්ත්‍රික්කයේ වර්ධනය වඩා වේගවත් වීමට දේශපාලන ශක්තිය ද බලපෑවේය. සෑම ගමක් පාසාම පාසල් ඉදිකිරීමු කෙරෙහි කෑගලු ගරු මන්ත්‍රීවරයා වූ පි. බී. ජී. කලුගල්ල මහතා උනන්දු විය. 1961 පාසල් රජයට ගැනීමත්, මේ වන විට විද්‍යෝදය, විද්‍යාලංකාර වැනි පිරිවෙන් විශ්වවිද්‍යාල කර තිබීමත්, ගරු මන්ත්‍රීතුමා අධ්‍යාපන ඇමතිවීම ත්, පාසල් ප්‍රමාණය වැඩිවීමට හේතු විය. එතුමා, "මම සෑම ගමකටම පාසලක් හැදුවා......," යන උද්දාම ප්‍රකාශනයෙන් සතුටට ද පත් විය.

දිස්ත්‍රික්කයේ සෑම කුඩා පාසැලකටම ගොඩනැගිලි, ගුරු නිවාස, අවශ්‍ය සම්පත් ලබා දී වර්ධනය කරන ලදි. අධ්‍යාපනයේ ප්‍රතිඵල මට්ටම ද මෙකල වර්ධනය වූ අතර, ප්‍රතිඵල මට්ටමෙන් ඉහළම දිස්ත්‍රික්ක තුනෙන් එකක් කෑගල්ල විය. මේ වන විටත් රටේ ආර්ථික ක්‍රමයේ හෝ අධ්‍යාපනයේ වෙනසක් නොවීම නිසා වේගයෙන් වැඩි වූ උගත් ශ්‍රම හමුදාව හා ආර්ථිකයේ ගැලපීමක් නොවූයෙන්, 1964 කාලය වන විට හුදු ශාස්ත්‍රීය උගත්කම අනුව විභාග සමත් වූ සංඛ්‍යාවට බලාපොරොත්තු වූ රජයේ හෝ සංස්ථා හෝ රැකියා විරල විය. යටත් විජිත සමයේ සිට ම පැවති අධ්‍යාපනයේ වෙනසක් නොවීම මීට හේතු විය. කෑගල්ලේ කාර්මික විද්‍යාල, වාගොල්ලේ හා උඩුගොඩ කෘෂිකර්ම පාසල් මගින් දුන් අධ්‍යාපනයට වැඩි දෙනෙක් ඇදී නොගියහ. මෙම ඉගෙන ගත් අය ද, ප්‍රායෝගික රැකියා නොව බලාපොරොත්තු වූයේ මෙම පාසල්වල නම්බුකාර රැකියා ය. මේ වන විට රැකියා සැපයිය හැකිව තිබුණේ ගුරු වෘත්තිය, පොලිසිය, සංස්ථා, ජනසතු ව්‍යාපාර ආදියෙහිය. රැකියා වලින් වැඩි හරියක් වියදම් රැකියා මිස ආදායම් රැකියා නොවීය. මේ නිසා සහතික ලත් උගතුන් රජයට බරක් වූ සේම විභාග අසමත් වීමෙන් පාසල්වලින් අ.පො.ස.(සා/පෙළ) දක්වා උගෙන පාසල් අත්හැර ගිය සිසුන් ද රැකියා විරහිත ශ්‍රම හමුදාවට එක් විය. දේශපාලකයින් විසින් ද රැකියා පොරොන්දු දෙන ලද නමුත්, රැකියා ඇති කළ හැකි අධ්‍යාපනයක් ගැන උනන්දුවෙන් කටයුතු කළා යයි සිතිය නොහැකිය. 1964 වන විට කෑගල්ල දිස්ත්‍රික්කයේ විරැකියාව උග්‍ර විය. 1965 අධ්‍යාපන ඇමති ඊරියගොල්ල මහතා ද වැඩහුරුව මගින් තරමක් දුරට හෝ වෙනසක් ඇති කිරීමට උත්සාහ කළත්, ගතානුගතික සමාජය ඒ දෙස බැලුවේ විචාරශීලීව නොවේ. අනෙක් අතට පැවති රටාව තුළ එය සුළු ප්‍රතිසංස්කරණයක් සේ පෙණින. එහෙත් වතු වගාව

යනාදිය දියුණු විය. මේ වන විට නැවතත් කෑගල්ල දිස්ත්‍රික්කයේ පමණක් නොව, මුළු රට පුරාම පාසල් සංඛ්‍යාව හා ගුරු සංඛ්‍යාව වැඩි වුවත් ශාස්ත්‍රීය අංශයට නැඹුරුව විභාග මත පදනම් වූ සමාජයට හෝ ආර්ථික නිෂ්පාදනයට යොමු නොවූ අධ්‍යාපන ක්‍රමය නිසා රැකියා විරහිත ශ්‍රම හමුදාව සංඛ්‍යාත්මකව වර්ධනය විය. මෙම තත්වයෙන් මිදීම සඳහා 1970 – 1977 කාලය තුළ ඇති කළ ප්‍රතිසංස්කරණ වැදගත් සේ බලපාන ලදී.

1970 දශකයේ දී මෙරටට ගැලපෙන ආර්ථික ක්‍රමයක් ද එයට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයක් ද ඇති කිරීමට උත්සාහ කරන ලදී. මේ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසල්වලවත් නව විෂයමාලා උගැන්වීම ආරම්භ කරන ලදී. මෙයින් බලාපොරොත්තු වූයේ මේ දක්වා පැවති තේරීමේ නැතිනම් වර්ගීකරණ ක්‍රමය අහෝසි කොට සැමට සමාන අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීමත්, සාධාරණව ජීවත්වීමට මඟ පෑදීමත්ය. මේ දක්වා පැවති අතිශය තරඟකාරී හෝ බොහෝ දෙනෙකු ඉවත්ට තල්ලු වන ක්‍රමය වෙනස් කිරීමයි. මෙම පන්ති අධ්‍යාපන ක්‍රමය නිසා වරප්‍රසාද ලත් සුළු පිරිසක් විශ්වවිද්‍යාලයට ගිය නමුත් මේ වන විට ඔවුන්ට ද රැකියා නොමැති වූ බව අපි දුටුවෙමු. 1952 පහළ බාලාංශයට ඇතුල් වූ ලක්ෂ ගණනින් 1961 විශ්වවිද්‍යාලයට තේරුණේ 1000කට ආසන්න ගණනක් පමණි. මේ නිසා පාසල් යන සංඛ්‍යාව අඩු විය. පාසල් අත්හැර යාම වැඩි විය. අසමත් වීම වැඩි විය. දෝෂය පුද්ගලයන්ගේ නොව අධ්‍යාපනයේ මෙන් ම, වැරදි අධ්‍යාපනය ගෙන ගියවුන්ගේ ද විය. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් උත්සාහ කළේ ළමුන් තේරීම නොව සැමට අධ්‍යාපනයක් ලබා දී 1 ශ්‍රේණියේ සිට හඳුන්වා දෙන ලද තේරීම් තරඟයට හුරු කිරීමේ ක්‍රමය නැති කිරීමට උත්සාහ ගැනීමයි. යෝජිත දේශීය සම්පත් වර්ධන ආර්ථික ක්‍රමයකට ගැලපෙන ප්‍රාග් වෘත්තිය

විෂයය සහිත ක්‍රියාකාරකම් පදනම් කර ගත් අධ්‍යාපන ක්‍රමයක් මේ නිසා ඇති කරන ලදි. මේ මඟින් 01% ක් පමණක් විශ්වවිද්‍යාලයට යාම වෙනුවට හැකිතාක් දුරට රටේ ආර්ථික නිෂ්පාදනයට - එකතු කළ හැකි උපාධිධාරීන් විශ්වවිද්‍යාලවලින් බිහි කිරීමට ද යෝජනා විය. මේ වන විට ජාතික ආදායමෙන් කෝටි 64 ක් එනම් 24% ක් අධ්‍යාපනයට වැය කළ බැවින් ඉන් උපරිම ප්‍රයෝජනයක් රටට ලබා දීම අපේක්ෂිත විය. මේ අනුව ලංකාවේ පළමු වතාවට, උත්පත්ති පූර්ව අවස්ථාවේ සිට පශ්චාත් උපාධි අවස්ථාව දක්වා වූ විධිමත් අධ්‍යාපන සැලැස්මක්, ඇති විය. ධනේශ්වර සමාජ රටාව ද පන්ති ක්‍රමයෙන් පෝෂිත වූ පිරිස් ද පන්ති හා කුල අවධාරණය කළවුන් ද මෙයට විරුද්ධ විය. කෑගලු දිස්ත්‍රික්කයේ විශාල ජන කොටසකගේ ප්‍රසාදය මෙයට ලැබිණ. දේශීය ආර්ථික නිෂ්පාදන අධ්‍යාපන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීම නිසා සමහර ප්‍රදේශවල ළමුන් රටේ පැවති විවිධ දේශීය කර්මාන්ත පුරුදු වී මුදල් උපයා ගෙවල් පවා සාදා ගත් බව සඳහන් වේ. මේ අධ්‍යාපන ක්‍රමය යටතේ ගමේ පාසල් අත්හැර නගරයේ පාසල් කරා යාමට මුදල් වියදම් කිරීමට අවශ්‍ය නොවීය. අපේ දේශයේ සමාජ ක්‍රමයට, ආර්ථික ක්‍රමයට සහ සංස්කෘතියට අනුරූප වන අධ්‍යාපනයක් ලබා දීම, අධ්‍යාපනික විෂමතා මඟහැරවීම, සෑම ළමයෙකුටම සමාන අවස්ථාවක් සැලසීම, අධ්‍යාපන ක්‍රමයෙහි අභ්‍යන්තරික ගුණාත්මක දියුණුවක් ඇති කිරීම සඳහා යොමු කළ මේ ක්‍රමය ජනතාවගේ නොදැනීම නිසා පවත්වාගෙන යා නොහැකි විය. මේ ක්‍රමය ක්‍රියාත්මක වූයේ නම් කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාථමික අධ්‍යාපනය (හෝ කුමන අධ්‍යාපනයක් හෝ) මොණරාගලටත් වඩා පහතට වැටී ඇතැයි පුන පුනා කියන්නට කිසිවකුටත් ඉඩ නොලැබෙන්නට තිබුණි. කාලීන අරමුණක් සහිත අධ්‍යාපන ක්‍රමයක් ඇති වූයේ නම් කෑගලු දිස්ත්‍රික් ළමා පරපුර පමණක් නොව මුළු

රටේම ළමා පරපුර පාසල්වලින් හැලී නොයන බැවින්, සාක්ෂරතා ඥානයෙන් ද කුසලතා වර්ධනයෙන් ද ක්‍රියාකාරකම් වලින් ද නිෂ්පාදනයට හවුල් වන ශ්‍රම හමුදාවක් අධ්‍යාපනයට වියදම් කරන කෝටි ගණන් ධනය ආපසු රටට ලබා දෙන ශ්‍රමික පිරිසක් මේ රටේ ඇති වන්නට ඉඩ තිබුණි.

එහෙත් 1977 දී නැවතත් අධ්‍යාපනය 1945 වන විට පැවති තත්වයට හැරුණු බව දැක ගත හැක. 1977 සිට පාසල් ගොඩනැගිලි, ළමයි සංඛ්‍යාව, භෞතික සම්පත්, මානව සම්පත් කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩි විය. නැවතත් ශාස්ත්‍රීය විෂය අධ්‍යාපනය හා විභාග ඉලක්ක ක්‍රමය ඇති විය. ළමුන් තෝරීම නැවත ඇති වීම නිසා හැලී යාම ද ආරම්භ විය. ප්‍රාථමික අධ්‍යාපනය ද බිඳ වැටිණ. පළමු ශ්‍රේණියේ සිට ම හැලී යාම නැවතත් ආරම්භ විය. 1977 දී අධ්‍යාපන කටයුතු කෙරෙහි ඇති වූ බලපෑම කෑගල්ල දිස්ත්‍රික්කයට පමණක් නොව පොදුවේ මුළු රටේ ම අධ්‍යාපනය කෙරෙහි ද බලපෑවේය. 1977 ආණ්ඩු පෙරළිය සමඟ බලයට පත් පක්ෂයේ ගුරු සංගම් දුළු පිරිස එය ඔවුන් ගොඩනැංවූ එකක් බව පෙන්වා පාසල්වල සිටි දක්ෂ ගුරුවරුන්, විදුහල්පතිවරුන්, මාරු කොට (කා.නි/ මා.අනි.කා.නි වශයෙන් නම් කෙරුණු) විදුහල්පතිකම් ඇති කරන ලදී. දේශපාලන බලය මත නුසුදුසු ලෙස බලය ලබා ගත් මෙම පිරිසට විරුද්ධව යා නොහැකි වූ ඔවුනට වඩා සුදුසුකම් ඇති ගුරුවරුන් මානසිකව වැටීම අධ්‍යාපනයෙහි බිඳ වැටීමට හේතු විය. රැකියාව රැක ගැනීම විනා සේවය ගැන සැලකීම අප්‍රධාන විය. පන්තිවල ඉගැන්වීමට පවා නොහැකි වූ සමහර අධ්‍යක්ෂවරුන් විය. මේ නිසා මොණරාගලට වඩා කෑගල්ල අධ්‍යාපනය වැටීම පුදුමයක් නොවේ. ගුරු උපදේශකවරුන් පවා තෝරන ලද්දේ වැරදි ලෙසය. එ පමණක් නොව සාක්ෂිවලින් ඔප්පු වන පරිදි 1977 දී ගුරු වෘත්තිය සඳහා ගණිතය පවා

නොමැති අය පත් කරන ලද බව පෙනේ. සාක්ෂරතාඥානය නොමැති ගුරුවරුන් ලවා වෙ අනුව ළමුනට කෙසේ නම් සාක්ෂරතාඥානයක් ලැබේවිද? විවෘත ආර්ථිකයක් සමඟ ඉගෙනගෙන රැකියා නැතිව සිටිනවාට වඩා වෙළෙඳ ආර්ථිකයට ගෝදුරු වූ බොහෝ දෙමාපියන් තම දැරියන් ඉතා අඩු වයසේ දි වෙළෙඳ සේවකයන් ලෙස හෝ යවන ලදී. මුදල් සෙවීම මිස අධ්‍යාපනය නිෂ්ඵල දෙයකැයි යන ප්‍රචාරය ද පැතිරිණ. කෙසේ හෝ සහතිකයක් ලබා ගත හොත් රැකියාවකට පැන ගත හැකිය යන ප්‍රචාරය නිසා තරුණ අසහනය උග්‍ර විය. එය මැඩලූයේ මර්දනයෙනි. කෑගල්ල දිස්ත්‍රික්කයේ භීෂණය වඩාත් උග්‍ර විය. අල්ලසට හා දූෂණයට මුල්තැන දී අභ්‍යාසලාභී ගුරු පත්වීම් පවා දීම නිසා නැවතත් 1991 වන විට අධ්‍යාපනය බිඳ වැටිණි. විශ්වවිද්‍යාල වසා දැමීම හා ශිෂ්‍ය මර්දනය ක්‍රියාකාරකම් නිසා උසස් පෙළ සමත් වී විශ්වවිද්‍යාලවලට තේරුණු සිසුන් අවුරුදු ගණන ගෙවල් වල රැඳී සිටීමට සිදු විය. ඉගෙනගත් අයට ද රැකියා නැති විය. දෙවෙනි කැරැල්ලට මේවා ද හේතු විය. කැරැල්ල මර්දනය කළා මිස අධ්‍යාපනය වෙනස් කළේ නැත.

1992 වන විට මුව ද තත්වය වූයේ එයයි. ගුරුවරු හා දෙමාපියවරු මෙහේදී කරුණු දෙකක් අපේක්ෂා කළබව පෙනේ. ස්වකීය දරුවාට රජයේ හෝ නමක් ඇති ප්‍රචාරයක් ඇති, අධිරාජ්‍යවාදී පන්ති ස්වරූපය පිළිබිඹු කරන පාසල් සොයා යාම ඉන් එකකි. මේ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ අධිරාජ්‍යවාදී නම් ඇති පාසල්වලට ළමුන ඇදෙන්නට විය. ගමේ පාසල වැටිණ. නගරයට හඹා එන පිරිස වැඩි විය. අධිරාජ්‍යවාදී කාලයේ මෙන් මු මැති ඇමතිවරු නගරයේ පාසල් සම්පත්වලින් පූර්වාලුහ. මේ අනුව ගමේ පාසලේ සාක්ෂරතා ප්‍රගුණ කිරීම බිඳ වැටිණ. 1 වසර සිට 11 වසර දක්වා 1979 සිට 1987 දක්වා කෑගල්ල

දිස්ත්‍රික්කයේ පාසල් හා අධ්‍යාපන කටයුතුවල වැඩි වීමක් දකිය හැක. 26.6% කින් සිසුන් සංඛ්‍යාව වැඩි වී ඇත. එහෙත් අධ්‍යාපන පහසුකම් ඇති පාසල් සංඛ්‍යාවේ ප්‍රතිශතය [54.6 සිට 52.2% ට අඩු වී ඇත. නාගරික පාසල්වලට සම්පත් විවිධාකාරයෙන් ගොඩගැසීම නිසා ද ගමනාගමන පහසුකම් වැඩි වීම නිසා ද ගමට වඩා නගරයට එවීම නම්බුවක් ලෙස සිතන නිසා ද ගමේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව ඉතා ශීඝ්‍රයෙන් අඩුවී ඇත. ගම්බද පාසල්වලට යෑමට ගුරුවරුන් පවා මැලි විය. නගරයේ පාසල්වල හා විදුෂත් පන්තිවල විද්‍යා, ගණිත, ඉංග්‍රීසි පාඩම් සඳහා ගුරුවරුන් ඇති බැවින් නාගරික ඉල්ලුම සමඟ ම තරඟ කළ නොහැකි පෞරාණික ගමේ පාසල ඇද වැටෙන්නට විය. එවැනි පාසලක සාක්ෂරතා ඥානය විමසා කෙස් පැලෙන තර්ක නම් කිරීමේ ඵලය කිම? "සියල්ලන්ටම අධ්‍යාපනය" නම් වාර්තාවේ සඳහන් වන අන්දමට කෑගල්ල දිස්ත්‍රික්කය වැනි ගම්බද පාසල් විශාල සංඛ්‍යාවක් ඇති ප්‍රදේශවල පාසල් පන්ති කාමර, ලිබඩු, ජලය සහ සෞඛ්‍යය අඩු විය. මෙම පාසල් සමාජ ආර්ථික වශයෙන් ඉතා පහත් තත්වයක සිටින පවුල්වලට සේවයක් සැලසූ අතර, පාසල් නොපැමිණීම හා හැර යාම අතින් පමණක් ඉහළ වෙයි. කෑගල්ල දිස්ත්‍රික්කයේ ගම්බද පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව 1980 සිට 1994 කාලය තුළ 60% කින් පමණ බැස ඇති අතර නගරික පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව 100% කින් වැඩි වී ඇත. මෙම වැඩි වීමට සමාජ ආකල්ප හා අධ්‍යාපනයේ වැරුද්ද බෙහෙවින් බලපා ඇත. 1945 දී කෑගල්ල දස්ත්‍රික්කයේ . පාසල් යා යුතු සිසුන්ගෙන් 58% ක් පාසල් ලේඛනවල ලියැවී ඇති අතර, 1986 වන විට 85% දක්වා වැඩි වී ඇත. මෙකල වුව ද සංඛ්‍යා ලේඛනවලින් හෙළි වූයේ 15% . ක් පාසල් නොයන බවයි. ප්‍රාථමික පාසල් සිසුන්ගෙන් 30% ක්

අධ්‍යාපනය අතරමග හැර යන බවත්, ඉහළට යන්නේ 70% ක් බවත් හෙළි වී ඇත.

1991 දී කෑගල්ල දිස්ත්‍රික්කයේ සිංහල, දෙමළ, මුස්ලිම් මුළු පාසල් සංඛ්‍යාව 611 ක් විය. 1 සී පාසල් 89 ක් ද 1 ඒ – බී පාසල් 19 ක් ද 2 – 3 වර්ගයේ සිංහල, දෙමළ, මුස්ලිම් පාසල් 503 ක් ද විය. 1992 දී කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසල් ගණන 599 ක් විය. මෙය 1991 ට වඩා අඩුවීමකි.

1992 දී දිස්ත්‍රික්කයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 180 603 ක් විය. මුළු ගුරු සංඛ්‍යාව 9 683 ක් විය. මෙම සංඛ්‍යාවලින් පාසල් හා අධ්‍යාපන කටයුතුවල වර්ධනය වූයේ ප්‍රමාණාත්මකව පමණකි. කෑගල්ල දිස්ත්‍රික්කයේ විභාග ප්‍රතිඵල විග්‍රහ කර බැලීමෙන් හෙළි වන්නේ 1953 සිට 1996 දක්වා ම ශිෂ්‍යත්ව, අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ, අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ, විශ්වවිද්‍යාල ප්‍රවේශ ඉතා ඉහළ මට්ටමක පවතින බවය. වැඩිම ලකුණු සංඛ්‍යා විග්‍රහ කළත්, අනෙකුත් දිස්ත්‍රික්ක අභිබවා සිටින බව සඳහන් කළ යුතුය. ප්‍රධාන පෙළේ ජනප්‍රිය පාසල්වල සාධන දර්ශකයන් 85% ඉක්මවා ඇති අතර, කනිටු විදුහල්වල වුව ද 40% ඉක්මවා ඇත. මෙහි විශේෂ ලක්ෂණයක් නම් පාසල් වර්ග අනුව සාධන මට්ටම් අතර පරතරයක් ඇති බවයි. විදුහල්වල අනන්‍යතාව ද සම්පත් ද මෙයට බලපා ඇත. 1996 දක්වා දිස්ත්‍රික්කයේ පාසල්වල සාධන මට්ටම් හෙළි කරන්නේ විවිධ විෂයයන්ට පවා වෙනස් බවයි. විශේෂයෙන් සියලුම විෂයයන්ටත් වඩා ගණිත, ඉංග්‍රීසි සඳහා වෙනස් බවත් ය. දිස්ත්‍රික්කයේ සමස්ත වශයෙන් මෙම විෂයයන්ගෙන් විභාග වලදී 50% කට වැඩි ප්‍රමාණයක් අසමත් වන බව පෙනේ. මීට හේතු වී ඇත්තේ විභාග ඉලක්ක කොට 6 වසරේ සිට මෙම විෂයයන් ළමයාගේ ප්‍රමාණයට

නුසුදුසු පරිදි ඉගෙනුමට සලසා තිබීමයි. 1978 වර්ෂයේදි ගණන් බලා ඇති අන්දමට 21% ක් මව්බස අසමත් වී ඇති අතර, අ.පො.ස. (උ/පෙළ) ට සුදුසුකම් ලබා ඇත්තේ 20% කට අඩු ප්‍රමාණයකි. කෑගල්ල දිස්ත්‍රික්කයේ උසස් ප්‍රතිඵල පෙන්වූ පාසල් වැඩි ප්‍රමාණයක් බොහෝ කාලයක් තුළ ඉගෙනීමෙහි දක්ෂ ශිෂ්‍යත්ව වැනි විභාග වලින් තෝරා ගත් සම්පත් ඇති ළමයි සිටින පාසල් විය.

1977 සිට 1995 දක්වා කාලය තුළ කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසල් හා අධ්‍යාපන කටයුතුවල විශාල වෙනස්කම් රාශියක් සිදු විය. අප මුලදි දුටු පරිපාලන වෙනස්කම්වලට අමතරව මේ දක්වා පැවති දිස්ත්‍රික් පාලන ක්‍රමයේ ද වෙනස්කම් ඇති විය. කෑගල්ල දිස්ත්‍රික් අධ්‍යාපන අධ්‍යක්ෂක යටතේ කොට්ඨාශ අධ්‍යාපන මාණ්ඩලික නිලධාරීන් සිටි අතර, ඔවුන්ට භාරව තිබූ කොට්ඨාශය නැවත පාසල් 10 ක් හෝ 15 ක් වන සේ ප්‍රධාන පාසලක විදුහල්පතිගේ නායකත්වය යටතේ කුඩා අධ්‍යාපන කලාප හා පසුව පර්ෂද වශයෙන් බෙදන ලදි. මේවාට බලතල නොවූ අතර පොත් බෙදීම, රෙදි බෙදීම, විභාග හා ක්‍රීඩා සංවිධානය, භාර විය. මේවා 1983 දි ආරම්භ වී 1987 පමණ වන විට දිය වී ගියේය. දැනුදු ඉහත සඳහන් කටයුතු මෙම ආයතන වලට භාර කර ඇත. මේවා පිහිටුවීමෙන් බලාපොරොත්තු වූ පොකුරු පාසල් අධ්‍යාපන සංවර්ධනය පිළිබඳ අදහස ක්‍රියාත්මක නොවීය. බලය විමධ්‍යගත වීමක් මේ මඟින් වූයේ නම් කිසියම් සංවර්ධනයක් බලාපොරොත්තු විය හැකි විය. පළාත් සභා ක්‍රමය ඇතිවීම සමඟ ම සබරගමු පළාතේ අධ්‍යාපන කාර්යාලය යටතට බලය මධ්‍යගත කොට කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය අතිරේක කාර්යාලයක් වශයෙන් පවත්වා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල ක්‍රමය ඇති කරන ලදි. මේ අනුව බලය විමධ්‍ය ගත කොට කෑගල්ල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කොට්ඨාසවලට අධ්‍යාපන

කටයුතු, මුදල් කටයුතු, ගුරු මාරු කිරීම්, අධීක්ෂණ කටයුතු පවරා දුන් අතර කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලයට වඩා සාර්ථක පාලනයක් ගෙන යාමට පහසු විය. සීමිත කොට්ඨාශයක් වීම නිසා අධ්‍යාපන කටයුතු පහසු විය. 1996 දි මෙම විමධ්‍යගත පාලන සංවිධානය අධ්‍යාපන කලාප බවට පත් කිරීමෙන් එය තව දුරටත් සාර්ථක පාලන ව්‍යුහයක් බවට පත් කොට ඇත. මේ අනුව 1996 මාර්තු මස 01 දින සිට කෑගල්ල දිස්ත්‍රික්කය ප්‍රධාන අධ්‍යාපන කලාප 03 ට එනම් කෑගල්ල, දෙහිඕවිට, මාවනැල්ල වශයෙන් වෙන් කර ඒවා යටතේ නැවතත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව අධ්‍යාපන කොට්ඨාශ වශයෙන් විමධ්‍යගත පාලනයක් අධ්‍යා/ලේ ගේ අංක:3/පිටි.ආර්/පී.පී/පී.ඒ/ 110 හා 95.03.02 චක්‍රලේඛනය අනුව සංවිධානය කරන ලදී. මේ අනුව කෑගල්ල කලාපය කෑගල්ල, ගලිගමුව, දැදිගම, වරකාපොල කොට්ඨාශවලින් ද මාවනැල්ල කලාපය මාවනැල්ල, අරණායක, රඹුක්කන කොට්ඨාශවලින් ද දෙහිඕවිට කලාපය දෙහිඕවිට, රුවන්වැල්ල, යටියන්තොට, දැරණියගල හා කිතුල්ගල කොට්ඨාශවලින් ද සෑදී ඇත. කෑගල්ල කලාපයේ පාසල් 195 හා ළමුන් 65058 ක් ද මාවනැල්ල කලාපයේ පාසල් 173 ක් හා ළමුන් 54643 ක්ද දෙහිඕවිට කලාපයේ පාසල් 240 ක් හා ළමුන් 60315 ක් ද වෙයි. මාවනැල්ල ගුරුවරු 3109 ක් ද දෙහිඕවිට ගුරුවරු 3062 හා කෑගල්ල ගුරුවරු 3836 ක් ද වෙයි. කෑගල්ල හා මාවනැල්ල ගුරු අතිරික්තයක් ඇත. දෙහිඕවිට කලාපයේ ගුරු ඌනතාවක් පවතී. කෑගල්ල දිස්ත්‍රික්කයේ ම විද්‍යා, ගණිත, ඉංග්‍රීසි ගුරු ඌනතා ඇති අතර, කලා උපාධි අතිරික්තයක් පවතී. නාගරික පාසල් වලට ගුරුවරුන් ඒකරාශි වීමත්, ගම්බද පාසල්වලට නොයාමත් මෙයට හේතු වී ඇත. මෑත දි දිස්ත්‍රික්කයේ පාසල් වඩා ප්‍රියමනාප නොවන හා දුෂ්කර පාසැල් වශයෙන් වර්ගීකරණය කර ඇත. පාසල් පද්ධතිය හා අධ්‍යාපන කටයුතු

සමතාවයකට ගෙන ඒමට නම් ගුරු සහභාගිත්වය සංවිධානය කළ යුතුය. දැනට සිදු වන්නේ ගුරුවරුන් සොයා ළමුන් නගරයට ඇදී ඒම මිස පාසල් සොයා ගුරුවරුන් යාම නොවේ. පාසල්වල ගුරු සහභාගිත්වය සාධාරණීකරණය කළ යුතු අතර ශිෂ්‍ය සහභාගිත්වය අඩු පාසල් විචාරවත් කිරීමේ පදනම යටතේ ළමුන් 20 ට වඩා අඩු පාසල්වල ළමුන් ආසන්න ළමුන් වැඩි පාසලකට අනුයුක්ත කොට එම පාසල්වල සිටින ගුරුවරුන් දියුණු කළ හැකි යායුතු පාසල්වලට යැවීමෙන් සම්පත් අපතේ යාම වළකා අධ්‍යාපන කටයුතු දියුණු කළ හැකිය. දැනට ගණන් බලා ඇති අන්දමට මෙම පාසල් 30 ට ආසන්න ප්‍රමාණයක් හා ළමුන් 20 ට අඩු ගුරුවරු 06 ක් පමණ සිටින පාසල් ද ඇත.

දැනට කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසල් පද්ධතිය ජාතික පාසල් 1 ඒ, බී පාසල්ල 1 සී පාසල්ල 2 හා 3 පාසල්, දෙමළ මාධ්‍ය පාසල්, මුස්ලිම් පාසල්, පිරිවෙන් වශයෙන් වර්ගීකරණය කර ඇත. මෙම පාසල්වල තවමත් උගන්වනු ලබන්නේ තේරීමේ විභාග ක්‍රමය පදනම් කර ගත් විෂය මාලාවයි. මෙම විෂය මාලාව වෙනස් කළ යුතු බවත්, ඒ වෙනුවට ළමුන්ගේ කුසලතා වටහා ගෙන රටේ ආර්ථික දියුණුවට අදාළ වන සේ අධ්‍යාපන විෂය මාලාව විවිධාංගීකරණය ජනතා බලාපොරොත්තුවයි.

කෑගලු දිස්ත්‍රික්කය සඳහා දැනට ඇති පාසල් ප්‍රමාණවත් වේ. සම්පත් ඇති පාසල්වලට ලක්ෂ ගණන් මුදල් වැය කොට ළමුන් ඒකරාශි කිරීමට වඩා ළමුන් විසිරී යන පරිදි ප්‍රදේශබද පාසල්වල අඩුපාඩු සැලසීමෙන් සම්පත් අපතේ යාම වළකා ගත හැකිය. දැනට දිස්ත්‍රික්කයේ පාසල් කටයුතු සඳහා දෙනු ලබන විදේශ ආධාර අවංකව සංවර්ධනයට යෙදූ නිසාම දියුණු විය. සීඩා, ඩී. එස්. ඩී. අයි. ඩී. ඒ. මුදල් අවංකව සංවර්ධනයට යොදන පිරිස් මේ සඳහා තෝරා ගත යුතුය.

නිවැරදි, සාධාරණ, සංවර්ධනාත්මක, මිත්‍රශීලී අධීක්ෂණ හා සහය කටයුතු කිරීමෙන් ගුරු අභිප්‍රේරණය කිරීම ත්, යල් පැන ගිය න්‍යාය හා සමීක්ෂණ පමුණක් කළ හැකි ඉගැන්වීමට හෝ ඉගෙනුමට මඟ පෑදිය නොහැකි ගතානුගතික නිලධාරිවාදයෙන් හිස උදුම්මාගත් පිරිස් වෙනුවට සේවයට කැපවුණු හොඳ ප්‍රතිඵල පෙන් වූ ගුරු පිරිස් පාලන කටයුතුවලට යෙදීමත් අවශ්‍යය.

රජය සෑම අයුරකින් ම අධ්‍යාපනය වෙනුවෙන් ආයෝජනය කරන මුදල් ශිෂ්‍යයා වෙත යෙදවෙන පරිදි සංවිධානය විය යුතු වේ. එසේ කිරීමෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ සාක්ෂරතාඥානය, සාධන මට්ටම වඩාත් දියුණු කොට කෑගල්ල දිස්ත්‍රික්කයේ දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික සංවර්ධනය සඳහා ශිෂ්‍ය පරම්පරාව යොමු කර ගත හැකිය. එමෙන් ම කෑගලු දිස්ත්‍රික්කයේ ගුරු පිරිස් අවතක්සේරු කිරීමෙන් තොව පෙළඹවීමෙන් අධ්‍යාපන සංවර්ධනයට යොමු කළ හැකි වේ. 1997 වන විට ක්‍රියාත්මක වන ගුරු සේවා ක්‍රමය මේ සඳහා ඉවහල් වනු ඇත. තවද, දිස්ත්‍රික්කයේ ස්වභාවික ආර්ථික සම්පත්, කර්මාන්ත, කෘෂිකර්මය දියුණු කළ හැකි අධ්‍යාපන සැලැස්මක් තුළින් පාසැල් කාලය අවසන් කරන ශ්‍රම හමුදාව ආර්ථිකය හා මිශ්‍ර කළ හැකි වන බැවින් අනාගතයේ දී ශ්‍රම නිෂ්ඵලතාව වළකා ප්‍රදේශයේ සමාජ දියුණුවට අදාළ ශිල්පීය හා ශාස්ත්‍රීය ඥානයෙන් පිරිපුන් පරම්පරාවක් ඇති කර ගත හැකි වනු ඇත. වර්තමාන කෑගල්ල දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය සංවර්ධනය කළ හැක්කේ,

1. වෘත්තියට අදාළ හසුරු කුසලතා ප්‍රගුණ කිරීම
2 තෝරා ගත් වෘත්තිය පිළිබඳ අධ්‍යාපනාංශ ගැන අවබෝධ ඇති කිරීම
3 ප්‍රදේශයේ ප්‍රධාන වෘත්තීන් පිළිබඳ අවබෝධය ඇති කිරීම හා පුහුණු කිරීම හා එමඟින්

දෛනික ජීවිතයට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම.

4 විෂයගත දැනුම සහ වෘත්තීන් පිළිබඳ අධ්‍යාපනය සම්බන්ධ කිරීම, දැනුම ප්‍රායෝගික භාවිතයට යෙදීම.

5 ක්‍රියාකාරී නිෂ්පාදන සහභාගීත්වය තුළින් ආත්මාභිමානය ඇති කරවමින් ප්‍රදේශයේ අතීතයේ සිට පැවත එන කාර්මික නිෂ්පාදන වලට යොමු කරවීම, පාසල් ජීවිතය දුරංගනා ලොවක් නොව ජීවිතයට යථාර්ථවාදීව මුහුණ දීම සඳහා මග පෙන්වන ස්ථානයක් බව හා ජීවත්වන කාලය තුළ සාමයෙන් සිටීමට සමාජය අපේක්ෂා කරන නව සමාජයක් බිහි කරන තැනක් ද බව අවබෝධ කළ යුතුය. 1967 දී ප්ලවුඩන්, වාර්තාව පෙන්වා දුන් අන්දමට, පාසල ඉගැන්වීමේ සාප්පුවක් පමණක් නොව සාරධර්ම හා නව අදහස් සම්ප්‍රේෂණය කරන තැනක්, වීම අවශ්‍යය.

වර්තමාන තත්වයෙන් ඉදිරියට යාම සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසැල් විසින් කළ යුතුව ඇත්තේ ශාස්ත්‍රීය හා වෘත්තීය යන අංශ අතින් සමබර විෂය මාලාවක් දියත් කිරීම හා ඵලදායි ඉගැන්වීම්, හා ඉගෙනුම් ක්‍රියාවලින් කාර්යක්ෂම කිරීමය.